# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1725/30 - 2011 සැප්තැම්බර් 30 වැනි සිකුරාදා - 2011.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක 36

### 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

12(2) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(2) වගන්තිය යටතේ ක්‍රියාකරමින් සෑම නිෂ්පාදකයකුම හෝ වෙළෙන්දෙකු විසින් පහත සඳහන් කර ඇති තීන්ත වර්ග ඒ එක් එක් තීන්ත වර්ග සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නියම කරන ලද පහත දැක්වෙන ඊට අනුරූප සම්පූර්ණ ඊයම් ප්‍රමාණයට (Total Lead Content) අනුකූලව මිස නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, ඇසුරුම් කිරීම හෝ තීන්ත තොග හෝ සිල්ලර වශයෙන් බෙදා හැරීම, ගබඩා කිරීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

| | අවසරලත් උපරිම ඊයම් ප්‍රමාණය |
|---|---|
| සෙල්ලම් බඩු සහ ළමා උපාංග සඳහා වූ තීන්ත (HCI අම්ලයේ දියවෙන ප්‍රමාණය) | 90mg/kg |
| ඉනැමල් තීන්ත | 600mg/kg |
| බාහිර භාවිතය සඳහා වූ ඉමල්ෂන් තීන්ත | 90mg/kg |
| අභ්‍යන්තර භාවිතය සඳහා වූ ඉමල්ෂන් තීන්ත | 90mg/kg |
| බිම ආලේප කිරීම සඳහා භාවිතා කරන තීන්ත | 600mg/kg |

මෙම විධානය වර්ෂ 2013 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2011 සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

10-379


1A - G 15130— 485 (2011/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.